

# නුවර විරහව

අනුපමා ගනේගොඩ

වින්ධ්‍යා බැන්ද එක මට දරා ගන්න පුලුවන්..ඒත් අපි නිතර
ආ ගිය ගාර්ඩින් එකේ වෙඩින් ෆොටෝ ෂූට් එක කළා
කීවම දරා ගන්න පුලුවන් ද ...?
*ඒ ඔහුය.

පිපි මල් සේම හිනැහුණ නුඹෙ මුව මඬළ
අපෙ මල් හීන පිරි පේරාදෙණි උයන
මතකය වීසි කොට තැලි පිලි සලූ මතින
කොහොමද සොඳුර නුඹ ගියෙ මංගල ගමන

පඬුරු දමා ගැටඹට අපි උන බාර
පරමල් වැටී අසපුව ගිනි ගති රෑක
ආ ගිය ගමන් දත් සෙංකඩගල පාර
දන්නා තිබුණි නොහඳුනනා බව නුඹව

නුවරුන් යනෙන රජ වීදියෙ කෙළවරක
එල්ලා තිබුණි අපෙ ආදර මල් වඩම
දෑසින් ලෙහුණ කඳුලැලි ලූණු රස ඉහින
ඇහුණ ද සොඳුර හඬනා හඬ මහවැලිය

රොබරෝසියා පෙති විසුරුණ මල් යායේ
බොල් පිනි අසයි බඹරිඳු හැරගිය තාලේ
මල් පෙති සේම සුසිනිඳු නැති බව ආලේ
කලූගල් උනත් දන්නව ඇති මේ කාලේ

# THE PARTING

By ManelNanayakkara
Colombo

The bags are packed
Prayers have been said
It's time to say goodbye!
I gaze at my empty nest
And the one who is last to fly.
I see her eyes full of hopes and dreams
With her soul mate Down Under
While mine scan the years gone by
For a little girl with uniform and tie.
I look down at my wrinkled hands
That have held on to her so long
I must let go. I know I know.
My heart aches; my heart breaks
As with strength renewed
I sever the chord-the umbilical chord
That had bound her to me at birth.

# අම්මා

පද්මිණි ශ්‍රියාලතා

අම්මාය ඈ හිතින් මෙරක් බර දරන්නී
ලොවට රහසින් රැයේ සුසුම් වැල් මුදන්නී
රිදෙන බව දැන දැනම කටු ද පිරිමදින්නී
කටු පොකුරු අග පිපිණු සුවඳ මල් නෙළන්නී

සුළි නැගෙන සාගරේ සවිය ඈ අත්වැලයි
කඳු කඩා හැලෙන විට මහපොළොව ඈ සමයි
මඩ කඩිති මඟ අරින පෙර ගමන්කරු ඇයයි
සුළි නැගෙන සාගරේ සවිය ඈ අත්වැලයි

කම්හලේ වැඩ පොලේ වැඩ වලට ඈ සමයි
ලැබෙන විට නම් යමක් පියවරක් පස්සෙනුයි
අතවරය හැම තැනම උරුමයක් සේ දරයි
තැලෙන පොඩිවෙන යළිත් තැලෙන ගැහැණිය ඇයයි

කිත් යසස් පොබයමින් රටක් බබලවන්නී
අදට නොව හෙටට තව දූපුතුන් පතන්නී
බැති බරව ලෙන්ගතුව දැය සමය දොවන්නී
හදවතේ ශක්තියෙන් ලෝකයක් දිනන්නී



# Mona Lisa

Mona Lisa Mona Lisa
Do come back with your enchanting smile
Your enchanting smile

To me it was winter when I left thee
Overwhelmed by cold and darkness intense
A dreadful day it was all-round
Until I came back to my dingy home no warmth around.
Your enigmatic smile was a sight full of glee
Why pinned to a rock and not joined me?
You captured my heart dear
Nothing but you brings me cheer.
Boughs look pale, naked and no flutter
As your absence keep my feelings somber (sombre)
I see no beauty in others thick lips or invasive smiles
I'm left only with love-bitten wound that never clears.
I yearn for you in flesh
Not to be till I meet you afresh
Rugged up in bed with human warmth sadly lost
Except in dreams I enjoy every night.

Mona Lisa Mona Lisa
Do come back with your enchanting smile
Your enchanting smile

Dr. Mathu H. Liyanage






# රිදී සිත්තම

## මෙල්බන් හිදී රූ ගැන්වෙයි

දැනට විකාශය වෙමින් පවතින රිදී සිත්තම ටෙලි වෘතත්තාන්තයේ දර්ශන කීපයක් පසුගිය දා මෙල්බන්හි ස්ථාන කීපයකදී රූ ගැන්වුණි. ගිහාන් ප්‍රනාන්දු රඟ පෑ එම දර්ශන සඳහා මාලන් සුරවීර, සංජීව පෙරේරා හා විජිත කුමාර රංගනයෙන් දායක විය. ශ්‍රීනාත් මද්දුමගේ මෙම දර්ශන අධ්‍යක්ෂණය කළ අතර විජිත කුමාර කැමරාව මෙහෙයවූයේ ය.





**AUSTRAL + ASIA: Cultural Space, Theatricality and the Performance of Asia in Australasia**

Share your experience, discuss your practice & understand your cultural identity in this multicultural society - An event for artists-practitioners in theatre and performance, cultural policy-makers and academics.

15 -16 November 2012
Performing Arts Building, Monash University
Clayton Campus

A conference supported by:
Performance Research Unit, School of English, Communications & Performance Studies Monash Asia Institute, Faculty of Arts, Monash University
Monash Postgraduate Association

**For more information visit**
http://arts.monash.edu.au/ecps/conferences/austral-asia/
Or email tharanga.dandeniya@monash.edu or
reagan.maiquez@monash.edu